සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සැකසුම - ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය
ර/ඇඹි/හෙලඋඩකන්ද විද්‍යාලය

8 ශ්‍රේණිය - සිංහල | දෙවන වාරය | විසිදෙවන සතිය

## 13 වන පාඩම - වාක්‍ය රීති 1 (02 කොටස)

- නාම පද ලිංග භේදය ලෙස පමණක් නොව **වචන භේදය** ලෙස ද වාක්‍ය රීති යටතේ හඳුනා ගැනේ.
- මෙම වචන භේදය **ඒක වචන** සහ **බහු වචන** ලෙස ප්‍රධාන කොටස් 02 කි.
- ඒක වචන නාම පදයක් යනු **එක් අයෙක් (ගුරුතුමා) එක් දෙයක් (පැන්සල) එක් ස්ථානයක් (පාසල)** හැඳින්වීමට යොදන නාම පද වේ.
- බහු වචන නාම පද යනු **එක් අයෙකුට වැඩි (ගුරුවරු) එක් දෙයකට වැඩි (පැන්සල්) එක ස්ථානයකට වැඩි (පාසල්)** යනුවෙන් හැඳින්වීමට යොදන නාම පද වේ.
- පහත වගුව ඇසුරෙන් ඒක වචන සහ බහු වචන භේදය තව දුරටත් අවබෝධ කර ගත හැකිය.

| **ඒක වචන නාම පද** | **බහු වචන නාම පද** |
|---|---|
| දක්ෂයා | දක්ෂයෝ |
| ඇතා | ඇත්තු |
| ගැහැනිය | ගැහැනු |
| රට | රටවල් |
| තෑග්ග | තෑගි |
| ළමයා | ළමයි |
| පූසා | පූසෝ |
| ගස | ගස් |

ක්‍රියාකාරකම:

01. ඉහත සටහන සටහන් කර ගන්න.
02. පෙළපොතේ 108 පිටුව හොඳින් කියවා 109 පිටුවේ ලිඛිත අභ්‍යාසය කරන්න.
03. ඒක වචන සහ බහු වචන යොදා ගනිමින් වාක්‍ය 05 බැගින් ලියන්න.
04. පෙළපොතේ 110 පිටුවේ සඳහන් ලිඛිත අභ්‍යාසය කරන්න.